මගේ අංකය:- පුත්/මහාධි/ප්‍රසම්පාදන/03/I/2025

EWIS PERIPHERALS (PVT) LTD.
(10)
16 SEP 2025
RECEIVED

කළමණාකරු,
ඊවිස් පෙරිපරල්ස් ආයතනය,
නො. 142,
යතාමා ගොඩනැගිල්ල,
ගාලු පාර, කොළඹ - 03

Thisavi

**පුත්තලම මහාධිකරණ කලාපයට අයත් අධිකරණවල භාවිතා කරන ඡායා පිටපත් යන්ත්‍ර සඳහා ටෝනර් (Original) මිලදී ගැනීම සම්බන්ධවයි.**

පුත්තලම මහාධිකරණ කලාපයට අයත් අධිකරණවල භාවිතා කරන මේ සමඟ අමුණා ඇති ඇමුණුම් 01 හි සඳහන් පරිදි ඡායා පිටපත් යන්ත්‍ර සඳහා ටෝනර් මිල දී ගැනීමට පුත්තලම මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර ඇත.

02. ඒ අනුව, මේ සමඟ අමුණා ඇති ඇමුණුම් අංක 01 සම්පූර්ණ කර ඔබ ආයතනයේ මුද්‍රා තබන ලද මිල ගණන් 2025.09.29 වන දින ප.ව.1.30 ට පෙර රෙජිස්ට්‍රාර්, මහාධිකරණය, පුත්තලම යන ලිපිනයට ඉදිරිපත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටින අතර, මිල ගණන් බහාලන කවරයේ ඉහළ වම්පස "ඡායා පිටපත් යන්ත්‍ර සඳහා ටෝනර් " යනුවෙන් සඳහන් කර එවිය යුතු බවද දන්වා සිටිමි. තෝරාගනු ලබන ආයතනය විසින් අදාළ භාණ්ඩ පුත්තලම මහාධිකරණය වෙත ප්‍රවාහනය කිරීම සිදු කළයුතු වේ. (ඔබ ආයතනයේ මිල ගණන් පත්‍රයට අමතරව මේ සමඟ අමුණා ඇති ඇමුණුම් අංක 01 ක අනිවාර්යයෙන්ම සම්පූර්ණ කර ඔබගේ නම, අත්සන හා නිල මුද්‍රාව තබා එවීමට කටයුතු කළ යුතුය. ඇමුණුම් අංක 01 ක සම්පූර්ණ නොකර ඉදිරිපත් කරනු ලබන මිල ගණන් දැනුම් දීමකින් තොරව ඉවත් කරනු ලැබේ)

03. 2025.09.29 දින ප.ව.1.30 පසුවූ වහාම පුත්තලම මහාධිකරණ විවෘත අධිකරණ ශාලාවේදී අදාළ මිල ගණන් විවෘත කරනු ලබන අතර, ඉන් පසුව ලැබෙන මිල ගණන් භාර ගනු නොලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට ඔබට හෝ ඔබ විසින් විධිමත් ලෙස බලය පැවරූ නියෝජිත මහතෙකුට සහභාගී වීමට පුළුවන. (තැපෑලේදී නැතිවෙන හා ප්‍රමාද වන මිල ගණන් සම්බන්ධයෙන් අප ආයතනය වග කියනු නොලැබේ.)

**04.** තවද, ඇමුණුම් අංක 01 හි සඳහන් ටෝනර් වර්ග සඳහා ඔබ ආයතනය සතුව තොග ඇත්නම් පමණක් මිල ගණන් ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.

05. ඔබ ආයතනය විසින් ඉදිරිපත් කරන මිල ගණන් ලංසු විවෘත කරන දිනය වන 2025.09.29 දින සිට 2025.10.30 දින දක්වා වලංගු විය යුතුය.

06. මිලදී ගැනීම සම්බන්ධයෙන් වන අවසාන තීරණය පුත්තලම මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

07. වැට් සහිතව මිල ගණන් ඉදිරිපත් කරන්නේ නම් 2025 වර්ෂයට අදාල වැට් ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුයි.

රෙජිස්ට්‍රාර් ,
මහාධිකරණය - පුත්තලම.

**රෙජිස්ට්‍රාර් / නි. පිස්කල්**
**මහාධිකරණය**
**පුත්තලම**

2025.09.12 වන දින,
පුත්තලම මහාධිකරණයේදී ය.

ඇමුණුම - 01

**පුත්තලම මහාධිකරණ කලාපයට අයත් අධිකරණවල භාවිතා කරන ඡායා පිටපත් යන්ත්‍ර සඳහා Original ටෝනර් මිලදී ගැනීම**

| අනු අංක | ඡායා පිටපත් යන්ත්‍රයේ වර්ගය | අවශ්‍ය ටෝනර් මාදිළිය | අවශ්‍ය ටෝනර් ප්‍රමාණය | මුද්‍රණය කළ හැකි පිටපත් ප්‍රමාණය | එක් ටෝනරයක මිල | |
|---|---|---|---|---|---|---|
| | | | | | (වැට් රහිත) | (වැට් සහිත) |
| 01 | Konica Minolta Bizhub 367 | Konica Minolta Tn 323/367 | 03 | | | |
| 02 | Konica Minolta Bizhub 283 | Konica Minolta Tn 217 | 02 | | | |
| 03 | Canon image Runner 2625 | NGP - 84 | 02 | | | |

.............................................. .............................................. ..............................................

ලංසුකරුගේ නම ලංසුකරුගේ අත්සන හා නිල මුද්‍රාව දිනය